**මිණිපේ ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 01 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මිණිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**--------------------------------------**

**1.3.1 අවිනිශ්චිත ගිණුම්.**

**-------------------**

**අවිනිශ්චිත ගිණුමේ පවතින රු.13,369 ක බැර ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.**

**1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.29,873,508 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.4,569,432 ක් වී තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.24,931,102 ක් වු ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.24,475,107 ක් කර්මාන්ත ණයහිමියෝ වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,945,333 ක් විය.**

**1.3.3 විගණනය සදහා සාක්ෂි නොවීම.**

**---------------------------------**

**ගිණුම් විෂයයන් 02 ක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.451,344 ක් වු ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරිමට නොහැකි විය.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.12,102,564 ක් වු අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම**

රු.13,125,548 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.1,022,984 ක පිරිහීමක් දක්නට ලැබුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමග සැසඳීමේදී, රු.7,194,992 ක අඩුවීමක් නිරික්ෂණය වු අතර, ඒ සඳහා 2013 වර්ෂයේ මූල්‍ය පුරෝකථන වල දුර්වලතාවයන් මත විෂයයන් 05 ක ආදායම් අඩුවීම හා විෂයයන් 04 ක වියදම් වැඩිවීම හේතු වි තිබුණු බව නිරික්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය.

--------------------

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

-----------------------------------

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 633 | 684 | 556 |
| (ii) | බදු කුලී | 5,478 | 2,550 | 1,489 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 13,192 | 13,638 | 85 |
| (iv) | වෙනත් ආදායම් | 3,801 | 5,724 | 3,535 |

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.5,665,000 ක් හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය වී තිබුණි.

**2.3.2** වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.**392,938** ක ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.**553,934** ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය සියයට **53** ක් වූයෙන්, **2013** දෙසැම්බර් **31** දිනට අය වියයුතු ශේෂය රු.**443,421** ක් විය. එම ශේෂයෙන් **2014** දෙසැම්බර් **31** දිනට රු.**364,330** ක් තව දුරටත් අය වියයුතුව තිබුණි. **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **158(1)** හා **159(1)** වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන එම හිග ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3** බදු කුළී.

------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) **2013** දෙසැම්බර් **31** දිනට රු.**1,573,641** ක අය වියයුතු කඩ කුළී හා වැලි තොටුපළ බදු කුළී ශේෂයක් පැවති අතර, එම ශේෂයෙන් වසර **01** ක කාලයක් ඉක්ම වූ කඩ කුළී රු.**863,648** ක් විය. මෙම හිග ආදායම් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් **2014** නොවැම්බර් **21** දින දක්වා අනුගමනය කර නොතිබුණි.

(ආ) **2009** වර්ෂයේ තක්සේරුව මත කඩ කාමර කුළී තීරණය කර තිබුණු අතර, **2015** වර්ෂය දක්වා නව තක්සේරුවට අදාළව කාර්යයන් කිරිමට විගණන දිනය වූ **2014** නොවැම්බර් **26** දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**2.3.4** ජල ගාස්තු.

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.**1,583,616** ක හිගයක් පැවති අතර, වර්ෂය තුළ හිග ශේෂයෙන් අය කිරීම් සියයට **57** ක තරම් දූර්වල මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට රු.**1,879,022** ක හිග ශේෂයක් පැවති අතර, ඉන් අවුරුදු **01** ක කාලයක් ඉක්මවා තිබු ශේෂවල වටිනාකම රු.**687,222** ක් විය.

**2.3.5** ව්‍යාපාර බදු

**-------------**

**I.** **සභා බල ප්‍රදේශයේ මහා පරිමාණයෙන් පවත්වා ගෙන යනු ලබන ගඩොල්, වී මෝල් යනාදි ව්‍යාපාර සම්බන්ධව විධිමත් සමීක්ෂණයක් සිදු කර, සභාවට අය වියයුතු ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**II.** **බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන ව්‍යාපාර 27 ක් සදහා ව්‍යාපාර බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන්, සභාවට රු.96,000 ක මුදලක් අහිමි වී තිබුණි.**

**2.3.6** පරිසර බලපත්‍ර ගාස්තු

**------------------------**

**2013 වර්ෂයට අදාළව පරිසර බලපත්‍ර ලබා නොදීම හේතුවෙන්, එක් ව්‍යාපාරයකින් රු.7,400 ක් බැගින් ව්‍යාපාර ආයතන 18 ක් වෙනුවෙන් සභාවට රු.133,200 ක මුදලක් අහිමි වී තිබුණි.**

**2.3.7** දැන්වීම් පුවරු ගාස්තු

**---------------------------**

**2013 නොවැම්බර් 29 දිනැති අංක 1839 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ iv (ආ) කොටසට අනුව සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු 83 කින් සමාලෝචිත වර්ෂය සදහා රු.324,900 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**--------------------------**

**3.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**---------------------------------**

**මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1.65:1 වූ අතර, ඉකුත් වර්ෂයේ එය 1.55:1 ක් වුයෙන්, එම අනුපාතයන් ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. සමස්ත ජංගම වත්කම්වලින් සියයට 62 ක් හෙවත්, රුපියල් මිලියන 29.4 ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 86 ක් හෙවත්, රුපියල් මිලියන 24.5 ක කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**--------------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එන රු.623,957 ක් වූ ගිණුම් ශේෂ 05 ක් සම්බන්ධව සොයා බලා නිරවුල් කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි.**

**(ආ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2014 ජූනි 18 දිනැති අංක 2014/4 දරන චක්‍රලේඛයට අනුව, ආදායම් අය කර ගැනීමේ ව්‍යවස්ථාපිත වගකීමට සභා ලේකම්, ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක හා විෂයය භාර නිලධාරීන් බැදී සිටින බව අවධාරණය කර ඇතත්, අදාළ ආදායම් අය කර ගැනීමට වගකිවයුතු නිලධාරීන් ප්‍රමාණවත් ලෙස කටයුතු කර නොතිබුණි.**

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

**(අ) හසළක පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම.**

ප්‍රාදේශීය සභාවේ යෝජනාවකට අනුව, හසළක පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා රු.4,165,000 ක ප්‍රතිපාදන ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අදියර 03 ක් යටතේ ලබා දී තිබුණි. මෙම කර්මාන්තය එක් අදියරක් යටතේ සංවර්ධනය කිරීමේ හැකියාව තිබිය දී, ප්‍රසිද්ධ ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කිරීම බැහැර කරලීම සඳහා අදියර 03 ක් යටතේ ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි.

**(ආ) 04 - ඇල මාර්ගය සංවර්ධනය කිරීම.**

රු.436,713 කට ඇස්තමේන්තු කර, හසළක විවිධ සේවා සමූපකාර සමිතිය සමග 2014 මාර්තු 03 දින ගිවිසුම්ගතව ඉදි කිරීම් පවරා ඉදි කිරීම් සඳහා 2014 අප්‍රේල් 10 දින රු.300,000 න් වැය කර තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

i. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී මාලාවේ 178 ඡේදයේ විධිවිධානවලට අනුව, ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව හසළක විවිධසේවා සමූපකාර සමිතියට ඉදි කිරීම් පවරා තිබුණි.

ii. පස් කපා මාර්ගය පුරවා කාර්මික උපදෙස් අනුව, මාර්ගයේ අනුමත පස් අතුරා රෝල භාවිතා කර, තලා, මාර්ගය සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු කර, ඉදි කිරීම් පවරා පළමු කොටස් මුදල් ලෙස රු.300,000 ක් කොන්ත්‍රාත්කාර සමිතියට 2014 අප්‍රේල් 10 දින වවුචර් අංක 359 මගින් ගෙවීම් කර තිබුණ ද, 2014 නොවැම්බර් 27 දින සිදු කළ භෞතික පරීක්ෂාවේ දී, මාර්ගය ජනතාවට භාවිතයට ගත නොහැකි මට්ටමෙන් මඩ සහිත වගුරු මාර්ගයක් බවට පරිවර්තනය වී තිබුණු බවක් නිරීක්ෂණය විය.

iii. ඉටු කළ වැඩ කොටස් වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමිතිය විසින් බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව අධීක්ෂණ කාර්මික නිලධාරි පරීක්ෂා කර, සහතික කිරීමෙන් පසුව ගෙවීම් කළයුතු වුවත්, ඒ ආකාරයෙන් බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව 2014 අප්‍රේල් 10 දින වවුචර් අංක 359 මගින් පළමු කොටස් මුදල් ලෙස රු.300,000 ක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවීම් කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 සංයුක්ත සැළැස්ම.**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

රු.32,255,547 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සදහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම හේතුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය.**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.6 අයවැය පාලනය.**

**------------------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය සදහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සමග සැසදීමේ දි, ආදායම් විෂයයන් 03 ක සියයට 13 සිට සියයට 53 දක්වා ද, වියදම් විෂයයන් 04 ක සියයට 28 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව විගණනයේ දි නිරීක්ෂණය විය.**

**(ආ) ආදායම් ශීර්ෂ 04 කට අයත් උප විෂයයන් 05 ක් සදහා අයවැයගත කළ රු.47,260,000 ක් වු ආදායම් අයවීම් ප්‍රතිශතය සියයට 22.7 ක් විය.**

**(ඇ) ආදායම් ශීර්ෂ 04 කට අයත් උප විෂයයන් 06 ක් සදහා අයවැයගත රු.42,000 ක් වු ආදායමින් කිසිදු මුදලක් ආදායම් ලෙස උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**--------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) අභ්‍යන්තර විගණනය**

**(ඇ) කොන්ත්‍රාත් පාලනය**

**(ඇ) වත්කම් කළමනාකරණය**